## කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය

### නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2022

### සාක්ෂි හා අපරාධ නඩු විධාන නීතිය
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

I වන හා II වන කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු වේ.
ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

#### I කොටස

01. සහල් සහ පරිප්පු ආනයනය කරන ගාමිණී කැලණියේ ගබඩා දෙකක් පවත්වාගෙන යයි. 2022 ඔක්තෝබර් 10 වැනි දින රාත්‍රියේ A ගබඩාව ගිනිගෙන සහල් තොග සමඟින් මුළු ගබඩාවම විනාශ වී රාත්‍රී මුරකරුද මිය ගියේය. ඔක්තෝබර් 11 වන දින ගින්නෙන් සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා Lanka ගාමිණී Insurance Company (LIC) වෙත රක්ෂණ හිමිකම් පෑමක් ඉදිරිපත් කළේය. මෙම ගිනි තැබීම සම්බන්ධයෙන් ඔහුගේ හිටපු ගබඩා කළමනාකරු වන ජනිත් සැක කරන බවත්, ඊට හේතුව 2022 සැප්තැම්බර් 26 වැනි දින දුර්වල කාර්යසාධනය හේතුවෙන් ජනිත්ව සේවයෙන් ඉවත් කිරීම බවත් ගාමිණී පොලිසියට දන්වා සිටියේය. ජනිත් වෙනුවට ගබඩා කළමණාකරු ලෙස පත් වූ කමිලා පොලිසියට මෙසේ පැවසුවේය, 'සැප්තැම්බර් 25 සවස "මට උඹව විනාශ කරන්න පුළුවන්" කියා ජනිත්, ගාමිණී සර්ට කියනවා මට ඇහුණා'. ජනිත් පොලිසියට පවසා සිටියේ 'ගාමිණී සර් මට A ගබඩාව ගිනි තියන්න කිව්වා, නමුත් මම එසේ කිරීමට ප්‍රතික්ෂේප කළා' යන බවයි. 2022 ඔක්තෝබර් 9 වැනි දින සියලුම පරිප්පු තොග A ගබඩාවේ සිට B ගබඩාව වෙත ගෙන ගිය බව පොලිසිය සොයා ගත්තේය. 2019 අගෝස්තු මාසයේදී නොදන්නා හේතූන් මත B ගබඩාව අර්ධ වශයෙන් ගිනි ගත් අවස්ථාවේදී ගාමිණීට Capital Insurance (CI) වෙතින් රක්ෂණ ගෙවීමක් ලැබී ඇති බව LIC අනාවරණය කර ගත්තේය. 2020 මැයි මාසයේදී ගින්නකින් පරිප්පු කන්ටේනර් දෙකක් විනාශ වූ අවස්ථාවේ ගාමිණී CI වෙත හිමිකම් පෑමක් ගොනු කළ නමුත් CI එම ගෙවීම ප්‍රතික්ෂේප කළ බවත් LIC සොයා ගත්තේය. මේ හේතුවෙන් ගාමිණී සිවිල් නඩුවක් පැවරූ අතර එය තවමත් විභාග වෙමින් පවතී. ගාමිණී පරිභෝජනයට නුසුදුසු සහල් ආනයනය කළ බවට පැමිණිල්ලක් ලැබීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 7 වැනි දින ආහාර සුරක්ෂිතතා අධිකාරිය (Food Safety

Authority- FSA) පරීක්ෂණ සඳහා සහල් සාම්පල ලබා ගත්තේය. සහල් සාම්පලයේ ඇතැම් කොටස් අධික ලෙස ආසනික් මඟින් දූෂිත වී ඇති බව ඔක්තෝබර් 15 වැනි දින FSA සොයා ගත්තේය. මෙම චෝදනාවලට පිළිතුරු දෙමින් ගාමිණී පොලිසියට දන්වා සිටියේ තමා 2022 ඔක්තෝබර් 10 වැනිදා රාත්‍රියේ චෙන්නායි ගුවන්තොටුපළේ සිටි බවත් ඔක්තෝබර් 11 වැනිදා අලුයම 2.00ට කොළඹට පැමිණි බවත්ය. මීට පෙර සිදුවූ ගිනි ගැනීම් දෙකේදීම ගබඩා කළමණාකරු ලෙස කටයුතු කළේ ජනිත් බවද ගාමිණී වැඩිදුරටත් පැවසීය.

ගිනිතැබීම සහ මුරකරුගේ මරණය සිදුකිරීම යන වැරදි සම්බන්ධයෙන් ගාමිණීට විරුද්ධව නඩු පවරන්නේ නම්, ඉහත සඳහන් කරුණුවල දෝෂී (inculpatory) හෝ නිර්දෝෂී (exculpatory) ස්වභාවය විශ්ලේෂණය කරමින් සාක්ෂිවල අනුකූලභාවය තක්සේරු කරන්න. ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීති නීතිය ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 100%)

02. රොහාන්, සුදේශ් සහ සෝභිත යනු විවිධ චෝදනා යටතේ පොලිසිය විසින් අත්අඩංගුවට ගත් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරීන් වේ. ඔවුන්ව විශේෂ රැඳවුම් මධ්‍යස්ථානයක වෙනම කාමරවල රඳවා සිටි අතර, ඔවුන් බැහැ දැකීමට ඔවුන්ගේ නීතිඥයින්ට සහ පවුලේ සාමාජිකයින්ට සතියකට එක් වරක් පමණක්, උපරිම වශයෙන් විනාඩි 30ක් සඳහා, අවසර දෙනු ලැබිණි. රොහාන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකට අත්අඩංගුවට ගෙන ඇති අතර සුදේශ් සහ සෝභිත අත්අඩංගුවට ගනු ලැබුවේ 1978 අංක 48 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේය. සෑම දිනකම පොලිසිය, සැකකරුවන් පැය දාහතරක පමණ කාලයක් ප්‍රශ්න කිරීමට ලක් කොට ප්‍රකාශ සටහන් කර ගනිමින්, නැවත නැවතත් එකම ප්‍රශ්න අසමින්, ආණ්ඩුව පෙරළීමට කුමන්ත්‍රණය කරන බවට චෝදනා කරමින් 'ඇත්ත කියන' ලෙස බල කළේය. යැයි ඉල්ලා සිටියහ. ප්‍රශ්න කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් චෝදිත අපරාධයන්ට සම්බන්ධ ලිපි, e-mail, අත්පත්‍රිකා ආදී විවිධ ලේඛන සොයා ගැනීමට පොලිසියට හැකි විය. පොලිස් පරීක්ෂක පාලිත, සෝභිතට කියා සිටියේ, 'වරද පිළිගන්නවා නම් අපි ඔබට ගෙදර යන්න දෙන' බවයි. පාලිත සුදේශ්ට කියා සිටියේ, 'ඔබ තිදෙනා ආණ්ඩුව පෙරළන්න සැලසුම් කළ බව රොහාන් පිළිගත්' බවයි. නමුත් රොහාන් එසේ ප්‍රකාශ කර නොමැත. ඔවුන් අත්අඩංගුවට ගෙන සති දෙකකට පසු, රැඳවියන් තිදෙනා තනි තනිව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මෙන්ඩිස් වෙත ඉදිරිපත් කළ අතර, ඔවුන් තනි තනිව ප්‍රකාශයක් ලබා දුන්හ. පසුව, රැඳවියන් තනි තනිව මහේස්ත්‍රාත් පෙරේරා හමුවට ඉදිරිපත් කළ අතර, තවත් වෙනම ප්‍රකාශ තුනක් සටහන් කර ගන්නා ලදී.

කිසියම් රැඳවියෙකු තම ප්‍රකාශ හරහා වරද පිළිගෙන තිබේ නම්, එවැනි ප්‍රකාශ අධිකරණයේ සාක්ෂි ලෙස භාවිත කළ හැකිද යන්න සහ සාක්ෂි ලෙස ලිපි, e-mail සහ අත්පත්‍රිකා පිළිගැනීමේ හැකියාවද අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරෙන් විවේචනාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 100%)

03. කුමාරි සහ සිල්වා 2021 මැයි මස විවාහ වී කුලී නිවසක පදිංචි විය. සිල්වා වෙනත් කාන්තාවක් සමඟ අනියම් ඇසුරක් පැවැත්වූ නිසා විවාහක යුවළ නිතර රණ්ඩු දබර ඇති කර ගත්හ. 2021 දෙසැම්බර් 12 වැනි දින කුමාරි ඇගේ මව වන බ්‍රිජට් වෙත ගොස් ඇගේ 'ජීවිතය අනතුරේ' බවත්, ඇගේ සැමියා ඇයට 'නරක දෙයක් කළ හැකි' බවත් දන්වා සිටියාය. කෙසේ වෙතත් එදිනම සිල්වා සමාව ගැනීමට පැමිණි නිසා කුමාරි සිය සැමියා සමඟ පිටත්ව ගියාය. කුමාරි ගැන කනස්සල්ලෙන් සිටි බ්‍රිජට්, එම දෙදෙනා පසුපස ගොස් කුමාරිගේ කුලී නිවසට යාබදව පදිංචිව සිටි ඉඩම් හිමියාගේ නිවසට වී රැඳී සිටියාය. තම දියණිය සම්බන්ධයෙන් කිසිඳු ගැටළුවක් සටහන් නොවූ බැවින් රාත්‍රී 9:30 ට පමණ බ්‍රිජට් ආපසු නිවසට පැමිණියාය. කෙසේ වෙතත්, කුමාරි දැඩි පිළිස්සුම් තුවාල ලබා රෝහල් ගත කර ඇති බව කුමාරිගේ ඉඩම් හිමියා බ්‍රිජට්ට එදිනම රාත්‍රී 11:30 ට පමණ ඇමතුමකින් දැනුම් දුන්නේය. බ්‍රිජට් රෝහලට ගිය අවස්ථාවේ කුමාරි පවසා සිටියේ 'සිල්වා මගේ ඇඟට පෙට්‍රල් වක්කරලා ගිනි තැබූ' බවයි. 2021 දෙසැම්බර් 15 වන දින උදෑසන කුමාරි කාන්තා පොලිස් නිලධාරිනියකට ප්‍රකාශයක් ලබා දෙමින් කියා සිටියේ තම 'සැමියා' පිළිස්සුම් තුවාල සිදු කළ බවයි. කුමාරි ඇගේ තුවාල හේතුවෙන් 2021 දෙසැම්බර් 15 දින සවස මිය ගියාය.

මෙම නඩුව මහාධිකරණයේ විභාග වීමට නියමිත බවත්, ඔබ පැමිණිලි පක්ෂයේ නීතිඥයා බවත් උපකල්පනය කරමින්, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරෙන් පහත කාරණා නඩු විභාගයේදී ඔබ ආමන්ත්‍රණය කරන්නේ කෙසේදැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න:

(අ) පරිවේෂණයෙ සාක්ෂි (circumstantial evidence)
(ආ) මරණාසන්න ප්‍රකාශ (dying declaration)

(ඇ) චූදිතයාගේ අයහපත් චරිතය පිළිබඳ සාක්ෂි (evidence of bad character of the accused)

(ලකුණු 100%)

04. ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරින් හේතු දක්වමින් පහත ප්‍රශ්න අතුරින් දෙකකට (2) පමණක් පිළිතුරු සපයන්න.

(අ) 'සාපරාධී ක්‍රියාපටිපාටියේදී, චූදිත පුද්ගලයාගේ සාවද්‍යතාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමේ භාරය සැම විටම පැමිණිලි පාර්ශවය වෙත පැවරෙන අතර, එම භාරය කිසිවිටෙක විත්තිකාර පාර්ශවය වෙත මාරු නොවේ. චෝදනා කරන ලද අපරාධයේ අංග සමහරක් පමණක් නොව සියල්ලම සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමේ වගකීම පැමිණිලි පාර්ශවය වෙත පැවරේ.'
– *Hakkini Asela De Silva v. AG* (SC Appeal No. 14/2011, decided on 17.01.2014)

(ආ) 'පොලිස් නිලධාරියාගේ සාක්ෂි විශ්වාසදායක සහ විශ්වාසනීය (reliable) වේ නම්, පොලිස් නිලධාරියෙකුගේ සාක්ෂි පිළිගැනීමට සහ ඒ මත පදනම්ව චූදිතයා වරදකරු කිරීම අධිකරණයට විවෘතය...එම සාක්ෂි තහවුරු (corroborate) කිරීම නීතිය අවශ්‍ය කරන්නේ නැත.'

– Sir John Woodruff and Syed Amir Ali, *Law of Evidence*, 1st edition, Vol. I, page 601

(ඇ) පූර්වනිගමන හා සම්බන්ධිත 114 වගන්තිය [සාක්ෂි ආඥාපනතේ] ප්‍රකාරව ස්වභාවික සිදුවීම්, මිනිස් හැසිරීම් පොදු හා පෞද්ගලික ව්‍යාපාරවල පොදු සිදුවීම් මාලා හේතුවෙන් සිදුවන්නට ඉඩ ඇති කරුණු වල පැවැත්මක් උපකල්පනය කිරීමට අධිකරණයට හිමිකම් ඇත. ආඥාපනත මගින් නිදර්ශන 8ක් 114 ප්‍රධාන වගන්තියට සම්බන්ධ කර ඇති අතර, එය සම්පූර්ණ විස්තර දැක්වීමක් නොවන (inexhaustive) අතර වෙනත් සමාන පූර්වනිගමන ඉදිරිපත් කළ හැකිය.

– *Piyaratne v. AG* (C.A. 203/2007, decided on 20.01.2015)

(ලකුණු 100%)

## II කොටස

05. මාස 6කින් සේවයට වාර්තා නොකළ 'ආමි නුවන්' නැමැත්තෙකු 'කුඩු ආශා' නැමති කාන්තාවකට අයත් නිවසක සැඟව සිටින බවට, අසල පිහිටි හමුදා කඳවුරක නිලධාරියෙකුගෙන් පොලිස් පරීක්ෂක (IP) විමර්ෂණ වෙත තොරතුරක් ලැබිණ. ආමි නුවන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් පරීක්ෂක විමර්ෂණ, සැරයන් සින්නතම්බි සහ කොස්තාපල් කුලරත්න සමඟ එම නිවසට ගියේය. ඔවුන් එකනට ගොස් දොරට තට්ටු කර ඇතුල් වීමට ඉල්ලා සිටියද ප්‍රතිචාරයක් නොලැබිණ. ආමි නුවන් නිවස තුළ සැඟව සිටින බවත් පලා යාමට ඉඩ ඇති බවත් සැක කළ පොලිස් පරීක්ෂක විමර්ෂණ, කොස්තාපල් කුලරත්නට වහලයේ උළු ගලවා නිවසට ඇතුළු වන ලෙස නියෝග කළේය. මෙම නියෝගය අනුව නිවසට ඇතුළු වූ කොස්තාපල් කුලරත්න කෑම මේසය මත ගංජා අඩංගු ප්ලාස්ටික් මල්ලක් දුටු බව කියා සිටියේය. ඔහු ඇතුළු වී විනාඩි 10-15 කට පසුව කොස්තාපල් කුලරත්න අනෙක් නිලධාරීන් දෙදෙනාට ඉදිරිපස දොර විවෘත කළේය. මේ අවස්ථාවේදී ආමි නුවන් සහ කුඩු ආශා නැවත නිවසට පැමිණි අතර, ඔවුන් දෙදෙනා අත්අඩංගුවට ගැනීමට පෙර පුළුල් ශරීර සෝදිසි කිරීමකට ලක් කරන ලදී.

(i) පොලිස් නිලධාරීන් තිදෙනා විසින් සිදු කරන ලද සෝදිසි කිරීම් සහ අත්අඩංගුවට ගැනීම් හි නීත්‍යානුකූලභාවය තක්සේරු කරන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 80%)

(ii) 1929 අංක 17 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනතේ 27 වන වගන්තිය ප්‍රකාරව තම නිවසේ තිබී සොයාගත් ගංජා මල්ල සම්බන්ධයෙන් කුඩු ආශා අපරාධ චෝදනා ලබා ඇත. නඩු විභාගය පැවැත්වෙන අතරවාරයේ, බර කිරා බැලීමේදී මුලින් සිදුවූ වැරදීමක් හේතුවෙන් චෝදනා පත්‍රයේ සඳහන් ගංජා ප්‍රමාණය කිලෝග්‍රෑම් 1.2 සිට 2.3 දක්වා සංශෝධනය කිරීමට පොලිසිය උත්සාහ කරයි.

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය උපුටා දක්වමින් එවැනි සංශෝධනයක නීතිමය ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 20%)

06. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීරණ ඇසුරෙන් ප්‍රශ්නයේ කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(i) 'සැකකරුවෙකු/චූදිතයෙකු රිමාන්ඩ් භාරයේ තැබීමේ අරමුණ වන්නේ අධිකරණයේ නඩුව කැඳවන සෑම දිනකම ඔහු අධිකරණය හමුවේ පෙනී සිටීම සහතික කිරීමයි. ඇප මත මුදා හැරීමෙන් පසු ඔහු අධිකරණයේ පෙනී සිටින බව අධිකරණයට හැඟේ නම් අධිකරණය ඔහු ඇප මත නිදහස් කළ යුතුය. අධිකරණය විසින් සැකකරුවෙකු/චූදිතයෙකු හට දඬුවම් කිරීම පිණිස ඔහුව රිමාන්ඩ් භාර ගත නොකළ යුතුය.'

- Sisira de Abrew J., Wickramasinghe v AG [2010] 1 SriLR 141

ඇප ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම ආශ්‍රිත ශ්‍රී ලංකාවේ නීතිය ඉහත ප්‍රකාශය හා අනුරූප වේදැයි විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 50%)

(ii) පොලිසිය වෙත ලැබෙන ප්‍රථම තොරතුරේ සහ විමර්ශනයක් අතරතුර රැස් කරගත් තොරතුරු වල සමානකම් සහ වෙනස්කම් සංසන්දනය කර වෙනස්කොට දක්වමින් ඒවායේ වැදගත්කම ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 50%)

*****